*සැ. යු.-* 2021.01.29 දින අංක 2213 දරන ගැසට් පත්‍රයෙ II. III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,214 - 2021 පෙබරවාරි මස 05 වැනි සිකුරාදා - 2021.02.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 72 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.-* (i) විවාහ (සාමාන්‍ය) (සංශෝධන) පනත් කෙටුම්පත් 2021 ජනවාරි මස 29 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

(ii) මුස්ලිම් විවාහ හා දික්කසාද (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත 2021 ජනවාරි මස 29 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 පෙබරවාරි 25 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 පෙබරවාරි 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

71- B 082201 — 353 (2021/01)
D 1 -

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය.

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී,
අංක 1161, මරදාන පාර,
කොළඹ 08.

............................*පැමිණිලිකරු*

*එදිරිව*

*නඩු අංක* : CHC330/15/MR
*ඇස්කීසි අංකය* : 38/19

මුතා මෙරින්ඥගේ ප්‍රේම ශාන්ත
නො. 207/1, නව ගාලු පාර,
මොරටුව.

............................*විත්තිකරු.*

දැනට මොරටුව, නව ගාලු පාර, නො. 207/1 හි පදිංචි විත්තිකරු වන මුතා මෙරින්ඥගේ ප්‍රේම ශාන්ත යන අය වෙතටයි.

වර්ෂ 2017 ක් වූ සැප්තැම්බර් මස 07 වන දින ඉහත අංක දරන නඩුවේ සමථ තීන්දු ප්‍රකාශය ප්‍රකාර, එනම් වර්ෂ 2015.05.25 වන දිනට රුපියල් දෙසීය හැත්තෑඑක්ලක්ෂ හතලිස්හතරදහස් තුන්සිය හැටදෙකයි ශත දහයක (රු.27,144,362.10) මුදලක් සහ එකී මුදලට 2015.05.26 වන දින සිට පැමිණිල්ලේ දින දක්වා මසකට 4% බැගින් පොළියක්ද ඉන්පසු පැමිණිල්ලේ දින සිට එකී සම්පූර්ණ මුදල මත එකී සම්පූර්ණ මුදල් ගෙවා නිම කරන දින දක්වා තීන්දු ප්‍රකාශිත මුදල මත නෛතික පොළියද අයකර ගැනීම සඳහා එකී විත්තිකරුට එරෙහිව ඇතුලත් කරන ලද සමථ තීන්දු ප්‍රකාශය අනුව නඩු ගාස්තුද ඉහත සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකරුට හට ගෙවිය යුතු බවට නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් ද, එසේම, විත්තිකරු විසින් සමථය ප්‍රකාර ගෙවීම් පැහැර හරින ලද හෙයින් තීන්දු ප්‍රකාශිත මුදලින්, ගෙවූ මුදල වන රුපියල් හතලිස් දෙලක්ෂ හැත්තෑදහසක (රු.4,270,000.00) මුදල අඩුකොට ඉතිරි මුදල අයකර ගැනීම සඳහා විත්තිකරුට එරෙහිව ඇස්කීසි ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

තවද. එකී නඩුවේ තීන්දු ප්‍රකාශය ඉටු කිරීමට එකී විත්තිකරු අපොහොසත් වී/පැහැර හැර ඇති හෙයින්, එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කීසියේ බලය පිට ඉහත නම් සඳහන් විත්තිකරු වන මුතා මෙරින්ඥගේ ප්‍රේම ශාන්ත යන අයට අයත් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළෙහි හිමිකම්, අයිතිවාසිකම් හා ඊට අදාල සෑම සියලු දේ, කොළඹ වාණිජ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින් අංක CHC330/15/MR දරන නඩුවේ නිකුත් කර ඇති ඇස්කීසි බලපත්‍රය අනුව වර්ෂ 2019 ක් වූ ජූලි මස 05 වන දින කර ඇති තහනමට යටත්ව, වර්ෂ 2021 ක් වූ පෙබරවාරි මස 18 වන දින පස්වරු 1.30 ට එකී දේපල පිහිටා ඇති මොරටුව, නව ගාලු පාර, අංක 207/1 හි ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*දේපලට පිවිසෙන මාර්ගය*.- නව ගාලු පාරේ සිට පානදුර දෙසට මීටර් 150 ක් පමණ ඉදිරියට ගමන් කරන විට මොරටුව දුම්රිය ස්ථානය ඉදිරිපස මෙම ඉඩම හමුවේ. මෙම ඉඩමට යාබදව වම් අත දෙසට නව ගාලු පාර සහ ශාන්ත සෙබස්තියන් පාර ද එක් වේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් (i) ගැණුම් මිළෙන් සියයට විසිපහක් (25%) ද, (ii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තිය (අ) යටතේ අයකිරීම්ද, (iii) විකුණුම් සඳහා වන සියලුම වියදම් මුදලින් ගෙවිය යුතුය. ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑපහ (75%) ක් වූ මුදල විකුණුම් දින සිට දින තිහක් (30) ඇතුළත එකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතුයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව නගර සභා සීමාව තුල පිහිටි මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, අංක 553A, මොරටුමුල්ල උතුර ග්‍රාම නිලධාරි වසමෙහි මොරටුවැල්ල පිහිටි උස්වත්ත වටරවුම් පාරෙහි වරිපනම් අංක 9/12 දරන්නාවූ ''නුගගහවත්ත'' නමැති ඉඩමේ අවසරලත් මිනින්දෝරු එල්. ආර්. එල්. පෙරේරා මහතා විසින් වර්ෂ 1987.01.24 වන දිනදී මැන සැදූ අංක 3090 දරන පිඹුරෙහි නිරූපිත කැබලි අංක 2B මායිම් : උතුරට : කලින් එල්. එම්. සිල්වාට අයත්ව තිබූ දැනට, ජෝන් වීරරත්නට අයත් ඉඩමද, එල්. ආර්. එල්. පෙරේරා නැමැති අවසරලත් මිනින්දෝරු තැන පිළියෙළකළ 1984.12.07 සහ 1985.02.12 දිනැති අංක 2773 දරන පිඹුරේ 1 බී කට්ටිය ද, නැගෙනහිරට : අඩි 4-6 දක්වා පළල අඩිපාර සඳහා වෙන් කිරීම (2773 දරන පිඹුරේ 1 සී කට්ටිය) සහ

පවතින අඩි පාරකින් සෑදෙන අඩි 11 ක් පළල පිවිසුම් මාර්ග ය ද, දකුණට ඃ අඩි 15 ක් පළල පවතින පාර (එල්. ආර්. එල්. පෙරේරා අවසරලත් මිනින්දෝරු තැන පිළියෙල කළ අංක 1077 සහ 1970.09.02 පිඹුරේ පැවති 2 කට්ටියේ කොටසක් ද) ද, බස්නාහිරට ඃ පාර සඳහා වෙන් කරන ලද මෙම ඉඩමේම කොටසක් ද, යන මායිම් අතර පිහිටි පර්චස් දොළහයි දශම තුනයි බින්දුවක (අ. 0, රූ.0, පර්. 12.30) විශාල බිම් ප්‍රමාණය ඉහත සඳහන් පිඹුරු අංක 3090 සහ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක. M3320/76 දරන පත්‍රිරුවෙහි ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩම දැනට දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක D222/43 දරන පත්‍රිරුවෙහි ලියාපදිංචි වී ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වාණිජ මහාධිකරණය.
කොළඹ 12.

2021 ක් වූ ජනවාරි මස 19 වන දී ය.

02-189

---

## පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹදී පවත්වනු ලබන වාණිජ මහාධිකරණයේ දී ය.

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
අංක 1161, මරදාන පාර,
කොළඹ 08.

.....................................*පැමිණිලිකරු.*

*කොළඹ වාණිජ මහාධිකරණය*
*නඩු අංකය* ඃ CHC829/18MR
*මහනුවර දිසා අධිකරණය*
*ඇස්කීසි අංකය*ඃ 12/2020

*එදිරිව*

1. පර්ෆෝමන්ස් ඔටෝමොබයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අංක 73/1ඒ, ධර්මපාල මාවත, කොළඹ 07.
2. කුලප්පු තන්ත්‍රිගේ චම්පික තුෂාර නමන්ත
නො. 16/2, සේනානි, බෙක්කේගම, පානදුර
3. සෙනෙවිරත්න අධිකාරම් මුදියන්සේලාගේ දිලීප නිර්මාල් කරුණාතිලක
අංක 406, මහවත්ත, බෝකුන්දර, පිළියන්දල

..........................................*විත්තිකරුවන්*

දැනට කොළඹ 07, ධර්මපාල මාවත, අංක 73/1 ඒ, හි පදිංචි 1 වන විත්තිකරු වන පර්ෆෝමන්ස් ඔටෝමොබයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් පානදුර බෙක්කේගම, සේනානි, අංක 16/2, හි පදිංචි කුලප්පු තන්ත්‍රිගේ චම්පික තුෂාර නිමන්ත සහ පිළියන්දල බෝකුන්දර මහවත්ත, අංක 406 හි පදිංචි සෙනෙවිරත්න අධිකාරම් මුදියන්සේලාගේ දිලීප නිර්මාල් කරුණාතිලක යන අයවලුන් වෙතටයි.

වර්ෂ 2019 ක් වූ මාර්තු මස 11 වන දින ඉහත අංක දරන නඩුවේ සමථ තීන්දු ප්‍රකාශය ප්‍රකාර, වර්ෂ 2018.09.18 වන දිනට රුපියල් පනස් ලක්ෂ දාසය දහස් හයසිය එකොළහක (රු.5,016,611.00) මුදලක් සහ එකී මුදලට 2018.09.19 වන දින සිට පැමිණිල්ලේ දින (එනම් 2018.11.13) දක්වා මසකට 4% බැගින් වූ පොළියක්ද, ඉන්පසු පැමිණිල්ලේ දින (එනම් 2018.11.13) සිට එකී සම්පූර්ණ මුදල මත එකී සම්පූර්ණ මුදල් ගෙවා නිම කරන දින දක්වා නෛතික පොළියද 1 වන 2 වන සහ 3 වන විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට නියෝග කරන මෙන් අණකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

අධිකරණයේ නිළධාරියෙකු විසින් තක්සේරු කරනු ලබන නඩු ගාස්තු ද ඉහත සඳහන් 2 වන විත්තිකරු විසින් පැමිණිලිකරු හට ගෙවිය යුතු බවට නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් ද,

තවද, එකී නඩුවේ තීන්දු ප්‍රකාශය ඉටු කිරීමට එකී 1 වන , 2 වන සහ 3 වන විත්තිකරුවන් අපොහොසත් වී පැහැර හැර ඇති හෙයින්, එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කීසියේ බලය පිට ඉහත නම් සඳහන් 1 වන, 2 වන සහ 3 වන විත්තිකරුවන් වන පර්ෆෝමන්ස් ඔටෝමොබයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් කුලප්පු තන්ත්‍රිගේ චම්පික තුෂාර නමන්ත සෙනෙවිරත්න අධිකාරම් මුදියන්සේලාගේ දිලීප නිර්මාල් කරුණාතිලක යන අයට අයත් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළෙහි හිමිකම්, අයිතිවාසිකම් හා ඊට අදාල සෑම සියලු දේ, කොළඹ වාණිජ මහාධිකරණයෙන් මා වෙත නිකුත් කරන ලද ඇස්කීසිය මත වාණිජ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින් වර්ෂ 2020 ක් වූ පෙබරවාරි මස 27 වන දින, නිසිලෙස තහනම් කරන ලද පහත උපලේඛනයේ සඳහන් දේපළ, වර්ෂ 2021 ක් වූ පෙබරවාරි මස 16 වන දින පෙරවරු 10.00 ට එකී දේපල පිහිටා ඇති ගම්පහ දිස්ත්‍රික්කයේ පරකන්දෙණිය ගමෙහි රෙනගල මාවතෙහි පිහිටි වරිපනම් අංක 0144 ඉඩමේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*දේපළට පිවිසෙන මාර්ගය*.- නුවර ප්‍රධාන මාර්ගයේ කොකිස් කඩය හන්දියෙන් කොස්හින්න කාපට් මාර්ගයේ මී. 400 පමණ ගිය පසු දකුණු පසින් රැපියල් තෙන්නකෝන් මාවත නැමති කොන්ක්‍රීට් මාවතෙන් හැරී මී. 10 ක් පමණ ගිය පසු වම් පසට මුහුණලා මෙම ඉඩම හමුවේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් ගැණුම්කරු විසින් මා වෙත ගෙවිය යුතුය.
සියලුම ගෙවීම් මුදලින් පමණක් කල යුතු අතර චෙක්පත් බාරගනු නොලැබේ.

1. සම්පූර්ණ ගැණුම් මුදලෙන් 25% ක මුදලක්, ඉතිරි 75% ක මුදල වෙන්දේසි දින සිට දින තිහක් (30) ඇතුළත ඉහත අංක දරන නඩුවට අධිකරණයේ තැන්පත් කළ යුතුය.
2. පිස්කල් ගාස්තු/වෙන්දේසි ගාස්තු සහ රජයේ ගාස්තු

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, මැද පත්තුවේ, ගම්පහ දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසයට අයත් අංක 244ඒ- පරකන්දෙණිය උතුර ග්‍රාම නිලධාරී වසමට අයත් පරකන්දෙණිය පිහිටි එස්. රාසප්පා නමැති බලයලත් මිනින්දෝරු තැන විසින් 2010.06.10 වන දින මැන සාදන ලද අංක 210/2010 දරන පිඹුරෙහි නිරූපිත කැබලි අංක "C1N" දරන කොටසට මායිම්, උතුරට : ප්‍රාදේශීය සභා පාරද, නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, දකුණට : රැපියෙල් තෙන්නකෝන් මාවත ද, බස්නාහිරට : ලොට් C1 ද, යන මායිම් අතර පිහිටි පර්චස් තිස්හතක් (අ.0, රූ. 0, පර්. 37) විශාල බිම් ප්‍රමාණය සහ මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ P645/22 දරන පත්‍රිරුවෙහි ලියාපදිංචි වී ඇත.

ඉහත සඳහන් ඉඩම පහත සඳහන් ඉඩමෙන් නැවත මැනීමක් සහ අනු බෙදීමකි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, ගම්පහ දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසයට අයත් අංක 244 ඒ - පරකන්දෙණිය උතුර ග්‍රාම නිලධාරී වසමට අයත් පරකන්දෙණිය පිහිටි එම්. ආරියසේන නමැති බලයලත් මිනින්දෝරු තැන විසින් 2007.10.28 වන දින මැන සාදන ලද අංක 2388 දරන පිඹුරෙහි නිරූපිත කැබලි අංක "C1" දරන කොටසට මායිම් : උතුරට : ඩබ්. පී. රූපසිංහට අයත් ඉඩම සහ ඩබ්. කේ. විජේරත්නට අයත් ඉඩම ද, නැගෙනහිරට : ඩබ්. කේ. විජේරත්නට අයත් ඉඩම සහ රැපියෙල් තෙන්නකෝන් මාවත ද, දකුණට : රැපියෙල් තෙන්නකෝන් මාවත සහ කැබලි අංක C1 ද, බස්නාහිරට : ඩබ්. පී. රූපසිංහට අයත් ඉඩම සහ කැබලි අංක C1 සහ පාර ද, යන මායිම් අතර පිහිටි රූඩ් තුනයි පර්චස් තිස්හයයි (අ.0, රූ. 3, පර්. 36) විශාල බිම් ප්‍රමාණය සහ මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පිඹුරු අංක 2388 දරන අංක M525/110 දරන පත්‍රිරුවෙහි ලියාපදිංචි වී ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය,
කොළඹ.

2021 ක් වූ ජනවාරි මස 13 වන දින දී ය.

02-188

---

**පිස්කල් විසින් කරනු ලබන ඉඩම් වෙන්දේසියක්**
කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය.

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී,
අංක 1161,මරදාන පාර,
කොළඹ 08.

.................................*පැමිණිලිකරු*.

*එදිරිව*

*නඩු අංකය :* CHC253/15/MR
*ඇස්කිසි අංකය :* 10/2018

මුතා මෙරිඤ්ඤගේ ප්‍රේම ශාන්ත
අංක 207/1, නව ගාලු පාර, මොරටුව

. ........................................*විත්තිකරු*

දැනට මොරටුව, නව ගාලු පාර, අංක 207/1 හි පදිංචි විත්තිකරු වන මුතා මෙරිඤ්ඤගේ ප්‍රේමශාන්ත යන අය වෙතටයි.

වර්ෂ 2015.04.23 වන දිනට රුපියල් තුන්සිය විසිනවලක්ෂ පනස්හයදහස් දෙසිය හැටදෙකයි ශත හැත්තෑවක (රු.32,956,262.70) මුදලක් සහ එකී මුදලට වර්ෂ 2015.04.24 වන දින සිට පැමිණිල්ලේ දින දක්වා මසකට 4% බැගින් පොලියක්ද ඉන්පසු පැමිණිල්ලේ දින සිට එකී සම්පූර්ණ මුදල මත එකී සම්පූර්ණ මුදල් ගෙවා නිමකරන දින දක්වා තීන්දු ප්‍රකාශිත මුදල මත පොළිය විත්තිකරුගෙන් පැමිණිලිකරුට අයකරගත හැකි බවට අණකොට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින්ද, එසේම,විත්තිකරු විසින් සමථය ප්‍රකාර ගෙවීම් පැහැර හරින ලද හෙයින් තීන්දු ප්‍රකාශිත මුදලින්, ගෙවූ මුදල වන රුපියල් දාහත්ලක්ෂ තුන්සිය දාහත් දහස් හත්සිය අනූවයි ශත හැත්තෑවක (රු.17,317,790.70) මුදල අඩුකොට ඉතිරි මුලු මුදල අයකර ගැනීම සඳහා විත්තිකරුට එරෙහිව ඇස්කිසි ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

තවද, එකී නඩුවේ තීන්දු ප්‍රකාශය ඉටු කිරීමට එකී විත්තිකරු අපොහොසත් වී /පැහැර හැර ඇති හෙයින්. එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කිසියේ බලය පිට ඉහත නම් සඳහන් විත්තිකරු වන මුතා මෙරිඤ්ඤගේ ප්‍රේම ශාන්ත යන අයට අයත් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළෙහි හිමිකම්, අයිතිවාසිකම් හා ඊට අදාල සෑම සියලු දේ, කොළඹ වාණිජ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින් අංක. CHC253/15/MR දරන නඩුවේ නිකුත් කර ඇති ඇස්කිසි බලපත්‍රය අනුව වර්ෂ 2018 ක් වූ පෙබරවාරි මස 22 වෙනි දින කර ඇති තහනමට යටත්ව, වර්ෂ 2021 ක් වූ පෙබරවාරි මස 18 වන දින පෙරවරු 11.30 ට එකී දේපල පිහිටි ස්ථානයේ දී ම වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

*දේපලට පිවිසෙන මාර්ගය.-* මොරටුව පරණ ගාලු පාරේ, පරණ පාලම ඔස්සේ පානදුර දෙසට මීටර් 100 ක් පමණ ගමන් කරන විට වම් අත දෙසට මෙම ඉඩම හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් ගැණුම්කරු විසින් මා වෙත ගෙවිය යුතුය.
සියලුම ගෙවීම් මුදලින් පමණක් කල යුතු අතර චෙක්පත් බාරගනු නොලැබේ.

1. සම්පූර්ණ ගැණුම් මුදලෙන් 25% ක මුදලක්. ඉතිරි 75% ක මුදල වෙන්දේසි දින සිට දින තිහක් (30) ඇතුළත ඉහත අංක දරන නඩුවට අධිකරණයේ තැන්පත් කළ යුතුය.
2. පිස්කල් ගාස්තු/වෙන්දේසි ගාස්තු සහ රජයේ ගාස්තු

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ පානදුර බද්දේ පානදුර ප්‍රාදේශීය සභාවේ පානදුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හොරේතුඩුව උතුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හොරේතුඩුව කුරුඳුවත්ත හෙවත් ගොරකගහලන්ද සහ පොකුනේවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ආර්. කුමාරගේ මහතා විසින වර්ෂ 2002 ක් වූ නොවැම්බර් මස 24 වන දින මැන සාදන ලද අංක 1681 දරන පිඹුරෙහි නිරූපිත කැබලි අංක A1 දරන කොටසට මායිම් , උතුරට : සී. සී. නන්දසේනට අයත් වරිපනම් අංක 6 දරන දේපළද, නැගෙනහිරට : වරිපනම් අංක 720 දරන මෙම ඉඩමේ ඉතිරි කොටස ද, දකුණට : වරිපනම් අංක 720 දරන මෙම ඉඩමේ ඉතිරි කොටස ද, බස්නාහිරට : කොළඹ සිට ගාල්ල දක්වා වන මහා මාර්ගය, යන මායිම් අතර පිහිටි පර්චස් දහඅටයි දශම නවයක (අ.0, රූ. 0, පර් 18.9) ක් විශාල බිම් ප්‍රමාණය සහ ඒ තුල පිහිටි සෑම සියලු දේ ද වේ. මෙම ඉඩම පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක D44/08 දරන පත්තිරුවෙහි ලියාපදිංචි වී ඇති අතර, බස්නාහිර පළාතේ පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුල හොරේතුඩුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටා ඇත.

රෙජිස්ට්‍රාර්/ නියෝජ්‍ය පිස්කල්,
කොළඹ වාණිජ මහාධිකරණය.
කොළඹ 12.

2021 ක් වූ ජනවාරි මස 19 වන දින දී ය.
කොළඹ 12, වාණිජ මහාධිකරණයේ දී ය.

02-190

## පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹදී පවත්වනු ලබන වාණිජ මහාධිකරණයේ දී ය

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී,
අංක 1161, මරදාන පාර,
කොළඹ 08.

........................පැමිණිලිකරු.

*නඩු අංකය* : CHC249/18/MR එදිරිව
*ඇස්කීසි අංකය* : 28/2019

1. බොලඳ හකුරු බුද්ධික විමුක්ති ගුණවර්ධන
ප්‍රියන්කර මාවත, සිරිපුර, නවඳගල
2. මුතුමාහන්දි සඳරේඛා ප්‍රේමතිලක මහේන්ද්‍රරාජා
සිරිසිදුහත් මාවත, හල්ගහවෙල්ල,
ඌරගස්මන්හන්දිය
3. බොලඳ හකුරු විජේපාල
සිරිපුර, අටකොහොට,
නවඳගල

*විත්තිකරුවන්*

දැනට නවඳගල, සිරිපුර, ප්‍රියන්කර මාවත හි පදිංචි 1 වන විත්තිකරු වන බොලඳ හකුරු බුද්ධික විමුක්ති ගුණවර්ධන යන අය වෙතටයි.

වර්ෂ 2018 ක් වූ ජූලි මස 05 වන දින ඉහත අංක දරන නඩුවේ සමථ තීන්දු ප්‍රකාශය ප්‍රකාර, එනම් වර්ෂ 2018.03.28 වන දිනට රුපියල් එකසිය විසිනවලක්ෂ හැටඑක්දහස් හතලිස්පහයි ශත හැටහයක (රු.12,961,045.66) මුදලක් සහ එකී මුදලට 2018.03.29 වන දින සිට පැමිණිල්ලේ දින දක්වා මසකට 4% බැගින් පොළියක්ද ඉන්පසු පැමිණිල්ලේ දින සිට එකී සම්පූර්ණ මුදල මත එකී සම්පූර්ණ මුදල් ගෙවා නිම කරන දින දක්වා තීන්දු ප්‍රකාශිත මුදල මත නෛතික පොළියද අයකර ගැනීම සඳහා එකී 1 වන විත්තිකරුට එරෙහිව ඇතුලත් කරන ලද සමථ තීන්දු ප්‍රකාශය අනුව නඩු ගාස්තුද ඉහත සඳහන් 1 වන විත්තිකරු විසින් පැමිණිලිකරු හට ගෙවිය යුතු බවට නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති බැවින්ද, එසේම, 1 වන විත්තිකරු විසින් සමථය ප්‍රකාර ගෙවීම් පැහැර හරින ලද හෙයින් තීන්දු ප්‍රකාශිත මුදලින්, ගෙවූ මුදල වන රුපියල් දසලක්ෂ පන්සිය හැටක (රු.1,000,560.00) මුදල අඩුකොට ඉතිරි මුලු මුදල අයකර ගැනීම සඳහා 1 වන විත්තිකරුට එරෙහිව ඇස්කීසි ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

තවද, එකී නඩුවේ තීන්දු ප්‍රකාශය ඉටු කිරීමට එකී 1 වන විත්තිකරු අපොහොසත් වී /පැහැර හැර ඇති හෙයින්, එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කීසියේ බලය පිට ඉහත නම් සඳහන් 1 වන විත්තිකරු වන බොලඳ හකුරු බුද්ධික විමුක්ති ගුණවර්ධන යන අයට අයත් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළෙහි හිමිකම්, අයිතිවාසිකම් හා ඊට අදාල සෑම සියලු දේ, කොළඹ වාණිජ මහාධිකරණයෙන් මා වෙත නිකුත් කරන ලද ඇස්කීසිය මත ඇල්පිටිය දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින් වර්ෂ 2019 ක් වූ සැප්තැම්බර් මස 04 වන දින, නිසිලෙස තහනම් කරන ලද පහත උපලේඛනයේ සඳහන් දේපළ, වර්ෂ 2021 ක් වූ පෙබරවාරි මස 22 වන දින පෙරවරු 11.00 ට එකී දේපල පිහිටා ඇති ඉඩමේදී හි ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*දේපලට පිවිසෙන මාර්ගය*.- කොළඹ නගරයේ සිට ගාලු පාර ඔස්සේ 62Km ක් පමණ ගොස් (A2 ට්‍රන්ක් පාර) කහඹිලියාකන්ද (බෙන්තොට) හංදියෙන් වමට හැරී 15Km පමණ ඇල්පිටිය පාරේ ගමන් කර ඌරාගස්මන්හන්දිය පසු කර දකුණට හැරුණු විගස 500m පහුවන හංදිය පසු කර තවත් 30m ඉදිරියට ගොස් කැබලි අංක 3F කොටසේ පාර දිගේ ගොස් වම්පසට ඇති ගල් පාර දිගේ ගමන් කරන විට මෙම ඉඩම හමුවේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් (i) ගැණුම් මිළෙන් සියයට විසිපහක් (25%) ද, (ii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තිය (අ) යටතේ අයකිරීම් ද, (iii) විකුණුම් සඳහා වන සියලුම වියදම් මුදලින් ගෙවිය යුතුය. ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑපහ (75%) ක් වූ මුදල විකුණුම් දින සිට දින තිහක් (30) ඇතුළත එකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතුයි.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වලල්ලාවිටි කෝරලේ බෙන්තර, කරන්දෙණිය දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසයේ කරන්දෙණිය ප්‍රාදේශීය සභා සීමාව තුල පිහිටි අංක 39, ඌරගස්මන්හන්දිය දකුණ ග්‍රාම නිලධාරී වසමට අයත් යටගල යන ගම පිහිටි "කැබලි

අංක 3D සහ කැබලි අංක 03 හි පරප වතුරෙ මානන'' නමැති ඉඩමෙහි පී. ඒ. ආර්. චන්ද්‍රසිරි බලයලත් මිනින්දෝරු තැන විසින් 2000.09.19 වන දින මැන සාදන ලද අංක 2818 දරන පිඹුර ප්‍රකාර එකී ඉහත සඳහන් ඉඩම වන : උතුරට : කැබලි අංක 3C සහ කැබලි අංක 3F (පාර) දරන ඉඩම ද, නැගෙනහිරට : පරප වතුරෙ මානන ද, දකුණට : පරප වතුර මානන හි කුවුන් නැමැති ඉඩමද, බස්නාහිරට : කැබලි අංක 3E දරන ඉඩම ද, යන මෙකී මායිම් තුල පිහිටි පර්චස් තිස්පහක් (අ. 0, රූ. 0, පර්. 35) විශාල බිම් ප්‍රමාණය විශාල බිම් ප්‍රමාණය සහ එහි පිහිටි ගහකොල පලතුරු ආදී සියලු දේ ද යන එකී දේපල සහ මෙම ඉඩම දැනට ඇල්පිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක J126/84 දරන පත්ඉරුවෙහි ලියාපදිංචි වී ඇත.

කේ.කේ. වසන්ත ප්‍රේමලාල්
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
ඇල්පිටිය.

2021 ක් වූ ජනවාරි මස 22 වන දින දී ය.

02-191

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු.* | *ශ.* |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2021 වර්ෂය** | | | |
| පෙබරවාරි | 2021.02.05 | සිකුරාදා | 2021.01.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.02.12 | සිකුරාදා | 2021.01.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.02.19 | සිකුරාදා | 2021.02.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.02.25 | බ්‍රහස්පතින්දා | 2021.02.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2021.03.05 | සිකුරාදා | 2021.02.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.03.12 | සිකුරාදා | 2021.02.25 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2021.03.19 | සිකුරාදා | 2021.03.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.03.26 | සිකුරාදා | 2021.03.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2021.04.01 | බ්‍රහස්පතින්දා | 2021.03.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.04.09 | සිකුරාදා | 2021.03.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.04.16 | සිකුරාදා | 2021.04.01 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2021.04.23 | සිකුරාදා | 2021.04.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.04.30 | සිකුරාදා | 2021.04.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.